# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1859/42 – 2014 අප්‍රේල් 25 සිකුරාදා – 2014.04.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

**අන්තිම කැමති පත්‍රයක් නොමැති දේපල සඳහා හිමිකම්පෑම් ඉදිරිපත් කරන ලෙස දැන්වීම**

**1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත**

(55 වන වගන්තිය)

කොළඹ දිස්ත්‍රික්කයේ හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මුල්ලේගම නමැති ගමේ විසූ මියගිය මලවිගේ ගංගා සමන් කුමාරි මෙනවියගේ අන්තිම කැමති පත්‍රයක් නොමැති දේපළ සම්බන්ධවයි.

මියගිය මලවිගේ ගංගා සමන් කුමාරි මෙනවියට අයත් ව තිබුණු හා මෙහි උපලේඛනයේ විස්තර කොට ඇත්තා වූ, අන්තිම කැමති පත්‍රයක් නොමැති දේපළට හිමිකම් කියා සිටින හෝ සම්බන්ධතාවයක් ඇති හෝ තැනැත්තෙකු/ තැනැත්තන් විසින් එකී අන්තිම කැමති පත්‍රයක් නොමැති දේපළට තමාගේ ඇති අයිතිය හෝ සම්බන්ධතාව කවරේදැයි 2014.06.04 දිනට පෙර පහත අත්සන් කරන අය වෙත ලිඛිතව ඉදිරිපත් කළ යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ. එසේ කිරීම පැහැර හරිනු ලැබුවහොත්, 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 55 වන වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්ති යටතේ ඒ දේපළ පිළිබඳ අයිතිය ලියාපදිංචි කිරීමට ඒකපාක්ෂිකව පියවර ගනු ලැබේ.

**ගාමිණී ඉලංගරත්න,**
හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්.

2014 අප්‍රේල් මස 21 වැනි දින,
බත්තරමුල්ල,
රජමල්වත්ත පාර,
"මිහිකත මැදුර", අංක 1200/6,
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ දී ය.



*සැ.යු.* - මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**උපලේඛනය**

| *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය* | *ගම* | *කැඩැස්තර සිතියමේ අංකය* | *ඉඩම් කොටසේ අංකය* | *ඉඩමේ ප්‍රමාණය* | *අයිතිය පිළිබඳ සහතිකයේ අංකය* | *ලියාපදිංචි කළ කාර්යාලය* |
|---|---|---|---|---|---|---|
| | | | | *(හෙක්ටයාර්)* | | |
| හෝමාගම | මුල්ලේගම | 520013 | කලාප 02 කැබලි අංක 63 | 0.0183 | 0021336 | හෝමාගම |

***සැළකිය යුතුයි.*** - එවැනි අන්තිම කැමති පත්‍රයක් නොමැති දේපළකට හිමිකම් කියා සිටින ලියුම්වල, ඒ දේපළට අදාළ කැඩැස්තර සිතියමේ අංකය, ඉඩම් කොටසේ අංකය සහ ඒ ඉඩමට හිමිකම් පෑමට තමාට ඇති අයිතිය සඳහන් කර තිබිය යුතුය. ලියුම් කවරයේ වම්පස උඩ කෙළවරේ ''අන්තිම කැමති පත්‍රයක් නොමැති දේපළ පිළිබඳ ඉල්ලුම් පත්‍රය'' යනුවෙන් ලියා තිබිය යුතු ය.

05-291

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.